# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,419 - 2025 ජනවාරි මස 10 වැනි සිකුරාදා - 2025.01.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## III කොටස : ඉඩම්

(වෙන වෙන ම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් : | |
| ප්‍රාරම්භක දැන්වීම් ... ... ... ... | — |
| අවසාන නියෝග ... ... ... ... | — |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දැන්වීම් ... ... | — |
| ආණ්ඩුවේ ඒජන්තවරු විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත ... ... ... ... | — |
| මධ්‍යම පළාත ... ... ... ... | — |
| දකුණු පළාත ... ... ... ... | — |
| උතුරු පළාත ... ... ... ... | — |
| නැගෙනහිර පළාත ... ... ... ... | — |
| වයඹ පළාත ... ... ... ... | — |
| උතුරු මැද පළාත ... ... ... ... | — |
| ඌව පළාත ... ... ... ... | — |
| සබරගමුව පළාත ... ... ... ... | — |

| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරී විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් .... ... ... | — |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් .... ... | 06 |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් .... ... | — |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම.... ... — | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් .... ... | — |


**සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳ ව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන්, ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලි ව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2025 ජනවාරි මස 31 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2025 ජනවාරි මස 17 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර තැපැලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක් නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය, හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**කේ. ජී. ප්‍රදීප් පුෂ්ප කුමාර ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2025 ජනවාරි මස 02 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

05 - B 82637—553 (2025/01)
C1-

# ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම්

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම
(104 වගන්තිය) සඳහා වූ නිවේදනය

බස්නාහිර පළාතේ පළාත් සභාවේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, කැලණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් ඒ. ඒ. ඩී. සී. නදීෂානි අමරසිංහ වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1990.03.26 දින ප්‍රදානය කර ඇති අංක ගම්/ප්‍ර/10782 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන කේ/13, නාහේන, හුණුපිටිය, වත්තල පදිංචි කලුදුරගේ මුදියන්සේලාගේ මැගිනෝනා වෙත ප්‍රදානය කොට කොළඹ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක සී1/102 යටතේ 1991.01.08 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද, ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය 2025.01.31 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

### උපලේඛනය

ගම්පහ පරිපාලන දිස්ත්‍රික්කයේ, කැලණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 256/ඒ, හුණුපිටිය දකුණ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, හුණුපිටිය නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, සර්වේ ජනරාල්වරයා විසින් සාදනු ලැබ, ඔහු භාරයේ ඇති සහ සර්වේයර් ජනරාල්වරයා විසින් සම්පාදිත අංක එල් 6/48 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි සර්වේයර් ජනරාල්වරයා විසින් සම්පාදිත අංක මු. පි. ගම් 424 දරන රේඛා සටහනේ අංක 25 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.019 ක් විශාලත්වය ඇත්තා වූ ද, පහත දැක්වෙන පරිදි මායිම වූ ද රජයේ ඉඩම, නාහේනවත්ත,

*උතුරට* - ප්‍රවේශ මාර්ගය,
*නැගෙනහිරට* - කැබලි අංක 3,
*දකුණට* - කැබලි අංක 30 1/2, ප්‍රවේශ මාර්ගය සහ කැබලි අංක 20 1/2
*බස්නාහිරට* - කැබලි අංක 26.

ඒ. ඒ. ඩී. සී. නදීෂානි අමරසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
මහර, කඩවත.

2023 ජුනි මස 06 වැනි දින,
කැලණිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
මහර, කඩවත.

01-41